# 8 මිහිඳු මාහිමි දායාද කළ උතුම් පුදසිරිත්

ලක්දිව බුදුසමයේ ඉතිහාසය සියවස් විසිපහක් තරම් ඈතට විහිද යයි. **මිහිඳු මහරහතන් වහන්සේ** ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලාගේ ආගමනය එම ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙන සමාරම්භක සිදු වීම යි. එ මඟින් අපට ලෝකයේ වෙනත් කිසිදු ආගමකට දහමකට දෙවන නො වන බුදුරදුන්ගේ දහම් දයාද වශයෙන් ලැබුණි. එය ඇදහිලි විශ්වාස පද්ධතියක් පමණක් නොව, නොයෙක් ආකාරයේ මෙරට ජන ජීවිතය හැඩ ගැස්වූ, එ සේ ම සංස්කෘතිය පෝෂණය කළ ශ්‍රේෂ්ඨ ධර්ම මාර්ගය යි. ඒ අනුව භාෂාව, සාහිත්‍යය, කලා ශිල්ප සිරිත් විරිත් පුද පූජා ක්‍රම, උත්සව ආදි මෙරට සංස්කෘතියේ සෑම අංගයක් ම පෝෂණය විය. මෙරට ආර්ථිකය ද දේශපාලනය ද බුදුදහම අනුව පෙළ ගැසුණු අතර එ මඟින් ද ඉහත කී සංස්කෘතිකාංග පෝෂණය කිරීමට අනුග්‍රහය ලැබුණි. පොදු ජනයාගේ ජීවිතය සමඟ එක් වූ සිරිත් විරිත් මෙන් ම බෝධිපූජා, ධාතු පූජා, ස්තූප පූජා, ආදිය ද විවිධ උත්සව ද බෞද්ධ සංස්කෘතිය තුළ ගොඩ නැගුණි. විශේෂයෙන් ම බෞද්ධයන්ගේ ශ්‍රද්ධා භක්තිය දියුණු කළ, හැදියාව ඔපවත් කළ එම බෞද්ධ පුදසිරිත් හා උත්සව ඔවුන්ට අහිංසක සතුටක් ලැබීමට හා සාමූහිකත්වය වර්ධනය කර ගැනීමට ද උපකාරී වූ බව පෙනේ.



විහාරස්ථානයක ප්‍රධාන වශයෙන් චෛත්‍ය තුනක් දක්නට ලැබේ. ශාරීරික, පාරිභෝගික, උද්දේසික යනු ඒවා ය. ඉන් පාරිභෝගික චෛත්‍යය ලෙස හැඳින්වෙන්නේ බෝධීන් වහන්සේ ය. බෝධීන් වහන්සේට කරන පූජාව බෝධිපූජාව නම් වේ. බෝධිපූජාවේ ඉතිහාසය පිළිබඳ ව විමසා බැලීමේ දී එය බුදුරදුන් ජීවමාන කාලය දක්වා ම විහිද යයි. ආනන්ද තෙරුන් වහන්සේ දෙව්රම් වෙහෙර දොරටුව ඉදිරිපිට ආනන්ද බෝධිය රෝපණය කළේ බුදුරදුන් හමුවීමට එන අයට වැඳුම් පිදුම් කිරීමටයි. එ බැවින් බුදුරදුන් හමු නො වන පිරිස බෝධීන් වහන්සේට වැඳුම් පිදුම් කළේ බුදුරදුන්ට වැඳුම් පිදුම් කිරීමක් වශයෙනි. ඒ අනුව වර්තමානයේ ද බෞද්ධයන් බෝධිපූජා පවත්වන්නේ බුදුරදුන්ට කරන ගෞරවයක් වශයෙනි.




## මහනුවර ශ්‍රී දළදා මාළිගාව

බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ප්‍රථම වතාවට බෝධිපූජාවක් පවත්වා ඇත්තේ බුද්ධගයාවේ ධර්ම චාරිකාවේ යෙදුණු ධර්මාශෝක අධිරාජයා විසිනි. සුවඳ පැන් සොළොස් කළයකින් බෝරදුන් නහවා එම පූජාව සිදුකොට ඇත. සිරිමා බෝරදුන්ගේ දක්ෂිණ ශාඛාව ලංකාවට එවන විට බෝධීන් වහන්සේ නැවීම සඳහා රන් කෙණ්ඩි අටක් ද එවා ඇත. ලක්වැසියෝ දිවමන් බුදුරදුන් දක්‍ක වැඳ පුදා ගන්නා අයුරින් බෝරදුන් වැඳ පුදා ගනිති. ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ආශීර්වාද ලබා ගැනීමට ලක් රජවරුන් බෝධි පූජා පවත්වා ඇත. රජවරුන් අභිෂේක උත්සව පැවැත්වීමට පෙර බෝරදුන්ගේ ආශීර්වාදය ලබා ගැනීම සිරිතක් විය. එසේ ම ලාංකිකයා තම ගොවිතැන්වලින් ලබා ගන්නා අස්වැන්නේ අග්‍ර කොටස අග්‍රශස්‍ය දනය වශයෙන් බෝරදුන්ට පූජා කිරීම ද සිදු විය. රටට සාගත විපත් වැනි දේ ඇති වූ විට රජතුමා ප්‍රධාන රටවැසියන් එකතු වී රටට සෙත් පතා සිරිමා බෝරදුන්ට පූජා පවත්වා ඇත. එය දින තුනක් හෝ හතක් ආදි වශයෙන් සිදු කර ඇති බව සඳහන් වේ.

වර්තමානයේ දී ද බෝරදුන් සුවඳ පැනින් හෝ කිරිවලින් නාවා පූජා පැවැත් වේ. එම පැන් කළ හෝ කිරි කළ හතක් හෝ සොළොසක් මෙන් ම විසි එකක් ආදි වශයෙන් සකස් කර ගනු ලැබේ. එසේ ම මල් පහන් පූජා කිරීම, මල් මාලාවලින් බෝ අතු සැරසීම සිදු කෙරෙයි. මෙයට අමතර ව බෝධීන් වහන්සේ වටා චීවරයක් දැවටීම ධජ පතාක එල්ලීම තවත් චාරිත්‍රයකි. ඇතැමෙක් බෝධීන් වහන්සේ දෙස බලාගෙන බුද්ධානුස්සති භාවනාව වැඩීම ද සිදු කරති.

සමහර කෙනෙක් පැන් කළ රැගෙන බෝධීන් වහන්සේ වටා ප්‍රදක්ෂිණා කරති. බෝධිපූජාව සඳහා ම විශේෂිත වූ ගාථා සහ කවි ගායනා කිරීම ද තවත් සිරිතකි. ඇතැම් විට ලෙඩ රෝග, ග්‍රහ අපල, නැති කර ගැනීමටත් විභාගාදියෙන් ජය ගැනීමටත් දින තුනක්, හතක් හෝ ඊට වැඩි ගණනක් බෝධිපූජා පැවැත්වීම සිදු වෙයි. මේ හැරුණු විට මෙරට සිංහල ජනයාගේ පුද්ගල නාමවලට ද බෝධි යන්න එක් වී ඇත. අග්බෝ, කුඩා අග්බෝ, සංඝ බෝධි යන රජවරුන් මෙහි දී සිහිපත් කළ හැකි යි. මේ හැර බෝධි පාල, බෝධිරත්න, බෝධි සිංහ ආදි පුද්ගල නාම රැසක් ද බෝධි යන්න එක්ව තැනුණු ග්‍රාම නාම ද රාශියකි. බෝපැත්ත, බෝමුණුව, බෝමලුව, බෝපිටිය, බෝගමුව ආදිය මීට නිදසුන් වේ. මෙ සේ මෙරට ජන ජීවිතයේ විවිධ පැතිකඩ නොයෙක් අයුරින් පෝෂණය කරමින් ගොඩ නැගුණු සංස්කෘතියට බෝධි සංස්කෘතිය යැයි ද කියනු ලැබේ. එය පොදු මහජනයාට නිරාමිස සතුටක් ආධ්‍යාත්මික පෝෂණයක් ලබා දීමට නොයෙක් අයුරින් උපකාරී වී ඇත. මෙම බෝධි සංස්කෘතිය අපට ප්‍රිය වූයේ ද අනුබුදු මිහිඳු මාහිමියන්ගේ ආගමනයේ ප්‍රතිඵලයක් වශයෙනි.

ධාතූන් වහන්සේලාට පුද සිරිත් පැවැත්වීම ද මහින්දාගමනයෙන් පසුව මෙරට බෞද්ධයන් අතර ප්‍රචලිත වූවකි. ශාරීරික හා පාරිභෝගික යැයි ධාතූන් වහන්සේලා දෙයාකාරයි. ශාරීරික ධාතූන් වහන්සේලා යනු බුදුරජාණන් වහන්සේගේ ශාරීරික කොටස් ය. බුදුරදුන්ගේ අස්ථිවල දැවී ඉතිරි වූ කුඩා කොටස් ද දන්ත ධාතු ද අකු ධාතු, ලලාට ධාතු, ග්‍රීවා ධාතු, කේස ධාතු, නඛ ධාතු ආදි ශාරීරික කොටස් ද මෙයට ඇතුළත් වේ. ධාතූන් තිබෙන විට බුදුරදුන් ද සිටිති යි යන විශ්වාසය මෙරට බෞද්ධයන් අතර මුල් බැස ගෙන ඇත. ගෞතම බුදුරදුන්ගේ ධාතු නොයෙක් ප්‍රමාණවලින් කැබලි වශයෙන් වෙන් වී ඇතැ යි පැරණි පොත පතෙහි ද දැක්වේ.




අනුරාධපුර ථූපාරාමය

එසේ ම තථාගත පරිනිර්වාණයෙන් පසු ධාතු නිදන් කොට වෙහෙර විහාර සාද ගරු කිරීමෙන් මතු සුගතිගාමී විය හැකි යැයි බුදුරජුන් වදළ බව ද පෙර සිට ම ධාතු වන්දනාව සහ පුද සිරිත් පැවැත්වීම ප්‍රචලිත ව තිබූ බව ද වංශකථාවල සඳහන් වෙයි. සර්වඥධාතු හැරුණු විට බුදුරජුන් ධරමාන අවධියේ සිට ම පිරිනිවන් පෑ රහතන් වහන්සේලාගේ ශාරීරික ධාතු ද ගෞරවාදරයට ලක් ව තිබේ.

**සැරියුත්,මුගලන්** ආදි රහතන් වහන්සේලා කිහිප නමකගේ ශාරීරික ධාතු තැන්පත් කොට ගෞරව කිරීමට බුදුරදුන් විසින් ම අනුශාසනා කොට ඇත. බුදු, පසේ බුදු, බුදු සව් හා සක්විති රජ යන මේ සතර දෙනාගේ ධාතු නිදන් කර ස්තූප සාද උපහාර දැක්වීමට ද අනුශාසනා කොට ඇත. පසු කාලීන ව ධාතූන් වහන්සේලා සතු බලය හා ආනුභාවය පිළිබඳ ව බලවත් විශ්වාසයක් මෙරට ඇති විය. විශේෂයෙන් ම මෙරට ධාතූන් වහන්සේලා අතර  දන්ත ධාතුව ඉමහත් සැලකිල්ලට ලක් ව ඇත. බුදුරජුන් වදාළ සුවාසූ දහසක් ධර්ම ස්කන්ධය ස්පර්ශ කළ එම උතුම් ධාතූන් වහන්සේ රජ දරුවන් හා භික්ෂූන් වහන්සේලා විසින්, ජීවිත පරිත්‍යාගයෙන් ආරක්ෂා කරන ලදී. නොයෙකුත් ආපදවලින් මුදවා ගැනීම සඳහා ගෙන ඇති පියවර ඉතිහාසයේ විස්තර කෙරෙයි. දන්ත ධාතූන් වහන්සේ මුල් කොට පවත්වන පුදසිරිත් රැසකි. මෙ කී ධාතූන් වහන්සේලා සහ ඒ ආශ්‍රිත පුදසිරිත් මෙරට ප්‍රචලිත වූයේ ද මහින්දගමනයේ ප්‍රතිඵලයක් වශයෙනි.

බුදුරදුන්ගේ හෝ රහතුන් වහන්සේලාගේ ශාරීරික හා පාරිභෝගික ධාතු නිදන් කර සාදන ලද පූජනීය ගොඩනැගිල්ල ශාරීරික චෛත්‍යය නම් වේ. එයට ස්තූපය, දාගැබ, යන නම් ද ව්‍යවහාර වේ. බොහෝ ස්තූපවල ශාරීරික ධාතූන් නිදන් කොට ඇති අතර ඇතැම් පැරණි ස්තූපවල බුදුරදුන් පරිභෝග කළ පාත්‍රය, වැඩ සිටි අසුන, ආදිය නිදන් කොට ඇත. මහින්දගමනයට පෙර සිට ම දඹදිව බෞද්ධයන් අතර පවා ස්තූප වන්දනාව  පැවතිණි. සාංචි ස්තූපය භාරතයේ ඇති පැරණි ම ස්තූපය යි. අපේ වංශ කථාවල සඳහන් වන පරිදි ලක්දිව ප්‍රථම ස්තූපය ලෙස සැලකෙන්නේ **මහියංගන** චෛත්‍යය යි. එම ස්තූපයේ බුරදුන්ගේ කේස ධාතු හා ග්‍රීවා ධාතු ව නිදන් කොට ඇත.

මහින්දගමනයෙන් පසු මෙරට ඉදි වූ ප්‍රථම ස්තූපය ථූපාරාමය යි. මේ හැරුණු විට මෙරට රජ දරුවෝ කලින් කල **අභයගිරිය, රුවන්වැලි සෑය, අම්භස්තලය, මිරිස වැටිය, කිරිවෙහෙර** ආදි සුවිසල් පූජනීය චෛත්‍ය ඉදි කළහ. මෙම ස්තූප මුල් කොට සිදුකරන ලද විවිධ පුදසිරිත් පිළිබඳ ව ඉතිහාසයේ සඳහන් වේ. භික්ෂූන් වහන්සේ නමක විසින් චෛත්‍යයක් වැඳිය යුතු ආකාරය පැරණි අටුවාවල විස්තර වශයෙන් දක්වා ඇත. බුද්ධාලම්භන ප්‍රීතියෙන්  යුක්ත ව  සෑ මලුවට නැඟිය යුතු ය. චෛත්‍යය විශාල නම් තුන් වරක් ප්‍රදක්ෂිණා කොට සතර පොළක දී වැඳිය යුතු ය.



මිහින්තලාව

චෛත්‍යය කුඩා නම් එ සේ ම තෙවරක් ප්‍රදක්ෂිණා කොට අට තැනක දී වැඳිය යුතු ය. මල්, පහන්, සුවඳ දුම්, පුදමින් බුදුගුණ ගායනා කරමින් දනුදු අපි චෛත්‍ය වන්දනාවේ යෙදෙමු. එම පුදසිරිත් තුළින් ද ශ්‍රද්ධාවත් බුද්ධාලම්භන ප්‍රීතියත් සිතෙහි තැන්පත් බවත් ඇති වේ. එය අපගේ හැදියාවට අවශ්‍ය පදනම සකස් කරයි. මෙම ස්තූප පූජාවන් ද ප්‍රචලිත වූයේ මහින්දගමනයෙන් පසුව යි. ධාතු වන්දනාවත් බෝධි වන්දනාවත් සමඟ ම විවිධ ආගමික උත්සව පැවැත් වීමේ සිරිත ද මෙරට ඇති වී තිබේ. වෙසක්, පොසොන්, ඇසළ ආදි සුවිශේෂ පොහෝ දිනවල පවත්වනු ලබන ආගමික උත්සව මෙහි දී ඉතා වැදගත් වෙයි. ලක්දිව සියලු ගම් නියම්ගම් හා නගරවල ඈත අතීතයේ පටන් ම එම බෞද්ධ උත්සව පවත්වා තිබේ. **දුටුගැමුණු** ආදි ශ්‍රේෂ්ඨ රජ දරුවන් විසින් ද එම උත්සවවලට නායකත්වය දෙමින් විශාල වශයෙන් අනුග්‍රහය දක්වා ඇති බව අතීතයෙන් පෙනේ. දහස් ගණන් මහජනයා පූජනීය ස්ථානවලට එක් රැස් වී මල්, පහන්, දැහැත්, ගිලන්පස, සුවඳ දුම්, ආහාරපාන යනාදිය තුනුරුවන් වෙනුවෙන් පූජා කර ඇත. ගුණ ගායනා කරමින් ඇතැම් විට පෙරහැර පවත්වමින් එම උත්සවය විසිතුරු ලෙස පවත්වා ඇති බව පෙනේ. මේ හැරුණු විට ධර්ම දේශනා උත්සව, කඨින පූජෝත්සවය ආදි අත්‍යලංකාරයෙන් සිදු කරනු ලබන ආගමික මහෝත්සව රැසකි.

අනුරාධපුර යුගයේ දී පවත්වන ලද ගිරිභණ්ඩ පූජා නම් මහෝත්සවයක් ගැන වංශකථාවල සඳහන් වේ. එහි දී මිහින්තලා පර්වතය තරම් උසට විවිධ පූජා වස්තු ගොඩ ගසා විසිහතර දහසක් භික්ෂූන්ට පූජා කළ බව කියැ වේ. එය මුලින් ම සිදුකොට ඇත්තේ මිහින්තලා මහසෑයේ වැඩ නිම වූ පසුව යි. මිහින්තලාව අවට යොදුනක් මානයේ සැරසූබව ද, ආලෝකවත් කළබව ද තොරණ සාද, කොඩි එල්ලා, දන් වැට තබ්බවා, රන් බෙර ගස්සවා, එම උත්සවය සිදුකළ බව ද සඳහන් වේ. ගංගාරෝහණ පූජෝත්සවය ද එබඳු ම තවත් පැරණි බෞද්ධ උත්සවයකි. **පළමුවැනි උපතිස්ස** රජු දවස ඇති වූ දුර්භික්ෂ භය, රෝග භය දුරු කිරීමට එය සිදුකළ බව සඳහන් වේ. එහි දී බුදුරදුන් විශාලා මහනුවර තුන්බිය ඇති වූ විට සිදු කළ පරිදි ම රතනසූත්‍රය දේශනා කරමින් පිරිත් පැන් ඉසිමින් නුවර වීථි සංචාරය කළ බව ද සඳහන් වේ. එසේ ම ධර්ම දේශනා පැවැත්වීම ද අතීතයේ පටන් ම උත්සවාකාරයෙන් සිදු වී ඇත. බුදුරදුන් වදළ **අරියවංස** සූත්‍රය දේශනා කිරීම ද පැරණි ලක්දිව පැවැත් වූ ජනප්‍රිය ආගමික උත්සවයකි. එය අරියවංස දේශනා උත්සවය නම් විය. විවිධ පුදසිරිත් සහිත ව නොයෙක් තැන දන් වැට තබ්බවා කලින් කල මෙම උත්සවය පවත්වා තිබේ. එ සේ ම මෙ බඳු උත්සව සඳහා දහස් ගණන් මහජනයා වෙහෙර විහාරස්ථානවලට හා නගරවලට රැස් වී ඇත. පිරිත් දේශනා කිරීම ද උත්සවාකාරයෙන් සිදු වී ඇති බවට සාධක තිබේ.

විවිධ අපල, උවදුරු, අමනුෂ්‍ය පීඩා ආදිය දුරුකර ගැනීමටත් දේවාශීර්වාදය ලබා ගැනීමටත් අස්වනු වැඩි කර ගැනීමටත් පිරිත් දේශනා උත්සව පැවැත් වූ බව පෙනේ. ධාතුන් වහන්සේලා මුල්කොට පවත්වනු ලබන ඓතිහාසික උත්සව අතර ඇසළ සමයෙහි සිදුවන දන්ත ධාතු පූජෝත්සවය කැපී පෙනේ. **කිත්සිරිමෙවන්** රජු දවස මෙරටට

වැඩමවන ලද දන්ත ධාතූන් වහන්සේ වඩාත් ආරක්ෂිත ව විශේෂ මන්දිරයක තැන්පත් කරනු ලැබූහ. එ තැන් පටන් ඉතිහාසය පුරා දළදා වහන්සේ මුල් කොට ගෙන පෙරහැර සහිත පූජෝත්සවයක් පවත්වා තිබේ. දළදා වහන්සේ රැක ගැනීමට විටින් විට විවිධ ස්ථානවලට රැගෙන ගිය අතර එම ස්ථානවල දී ද පුදසිරිත් කඩ නො කොට සිදු කළ බව පෙනේ.

මෙ සේ මහින්දාගමනයෙන් පසු මෙරට ජන සමාජය තුළ බෞද්ධයින් ඉමහත් ගෞරවයෙන් පවත්වන පුදසිරිත් හා උත්සව රැසක් ඇති අතර අතීත උරුමයන් ලෙස ඒවා රැක ගනිමින් ඉදිරියටත් පවත්වා ගෙන යාමට අපි ද සහාය වෙමු.

## සාරාංශය

මහින්දාගමනයෙන් පසු ලක්වැසියාට ලැබුණු දායාද අතර පුදසිරිත් විශේෂ වේ. බෝධි පූජාව, ධාතු පූජාව, ස්තූප පූජාව හා බෞද්ධ උත්සව යනුවෙන් ඒවා වර්ග කළ හැක. වෙසක්, පොසොන්, ඇසළ ආදි උත්සව ද ධර්මදේශනා, අරියවංස දේශනා හා දන්ත ධාතු පූජා ආදි වශයෙන් එම බෞද්ධ උත්සව හැඳින්විය හැකි ය. මේ අනුව ලක්දිව බුදු සමයේ ඉතිහාසයේ කැපී පෙනෙන වෙනසකට තුඩු දුන් මෙම දායාද රැක ගැනීම අප සතු වගකීමකි.

## ක්‍රියාකාරකම්

01. මහින්දාගමනයෙන් පසු ලාංකිකයාට උරුම වූ පුදසිරිත් නම් කරන්න.

02. එම පුදසිරිත් අප සුරැකිය යුත්තේ ඇයි දැයි පෙන්වා දෙන්න.

03. බෝධීන් වහන්සේ ජන ජීවිතය හා කොතෙක් දුරට සම්බන්ධ වී පවතින්නේ දැයි නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.

## පැවරුම

01. පහත සඳහන් උත්සවවලින් ඔබ කැමති උත්සව දෙකක් පිළිබඳ ව පුවත්පත් ලිපියක් සකස් කරන්න.

i) වෙසක් උත්සවය
ii) පොසොන් උත්සවය
iii) ඇසළ උත්සවය
iv) කඨින උත්සවය
v) දළදා උත්සවය

වැඩක නොයෙදූ සිත
නරක අතට ම පෙරළෙත
කිමෙක වන යහපත
වැඩක එබැවින් යොදනු තම සිත

සිරිත් මල්දම